**#mediaethicsSL #lka #EnglishPress #DailyMirror #February20**

අප ජීවත් වන සමාජය තුළ වෙනස් ලෙසින් කරනා සැලකීම් නැතිනම් කොන්කිරීම් බහුල වන බව කණගාටුදායක සත්‍යයයි. එහිදී ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පදනම් කරගනිමින් සිදුකෙරෙනා කොන් කිරීම් සැලකිය යුතු ප්‍රතිශතයක් වෙයි. යම් විටක අතීතයේදී එසේ වෙනස් ලෙසින් සැලකීමක් ලෙසින් නොගැනුණු යම් අදහසක් වර්තමානය වන විට වෙනස් ලෙසින් සැලකීමක් බවට පත්ව තිබෙන්නට හැකියාව තිබේ. ඩේලි මිරර් පුවත්පතේ විවාහය සම්බන්ධයෙන් වූ මෙම ලිපිය සංවාදයට බඳුන්විය යුත්තේ එනිසාවෙනි.

මෙම ලිපිය පුරා පැහැදිලිව පෙනෙනා තේමාව වන්නේ විවාහය විශේෂයෙන්ම කාන්තාව හට අනිවාර්ය වන බවයි, කාන්තාවකගේ සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය විවාහය මත යැපෙනා බවයි. එසේම කාන්තාවකට තනිව ජීවත් වීමට අප රටේ සමාජ වාතාවරණය හිතකර නොවන නිසා පිරිමියෙකුට වඩා කාන්තාවකට විවාහය අති වැදගත් බවද මෙහි දක්වා තිබේ.

සැබවින්ම මෙම ලිපියේ දක්වන ආකාරයට වර්තමාන කාන්තාව පිරිමියාට වඩා පොදුවේ අසරණ යැයි, දුබල යැයි සැලකිය හැකිද? මෙවැනි අදහස් ජනගත කිරීම කාන්තාවට වෙනස් ලෙසින් සැලකීමක් නොවන්නේද? විවාහය ඇතුළු ඕනෑම කාරණයක් සම්බන්ධයේදී කාන්තාව හෝ පිරිමියා ලෙසින් වෙනස් ලෙසින් සැලකීමක් නොතිබීම නවීන සමාජයක යහ ලක්ෂණයක් නොවන්නේද? මේ සංවාදයකට ප්‍රවේශයයි.

An opinion piece was recently published in the Daily Mirror where marriage was seen as an obligation for all women. It also mentioned that the success or failure in life of a woman is determined by her marriage. It further mentioned that Sri Lanka does not possess a conducive environment for women to live alone, therefore marriage was seen as a necessary requirement for women in comparison to men.

The context of this opinion piece proposes that women in the present day are generally weaker and more vulnerable in society than men. Should women be placed in the above mentioned context especially in an opinion piece published in a newspaper?